# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

## PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2019.10.08

ප්‍රවෘත්ති කර්තෘ/ සංස්කාරක,

**<u>ජනපති අපේක්ෂකයන්ට විවෘත ආයාචනයක්</u>**

ශ්‍රී ලංකා ජනාධිපතිවරණ ඉතිහාසය තුළ වැඩිම අපේක්ෂකයන් පිරිසක් තරඟ කරන මැතිවරණය බවට 2019 නොවැම්බර් 16 දින පැවැත්වීමට නියමිත මැතිවරණය පත්වී ඇත. වැඩි අපේක්ෂකයින් පිරිසක් තරඟ කිරීම හරහා තියුණු තරඟකාරී තත්ත්වයක් මැතිවරණ ප්‍රචාරක කාලය තුළ ඇතිවිය හැක.

එසේම අප මුහුණදෙමින් සිටින්නේ රටේ රාජ්‍ය නායකයා විධායකයේ ප්‍රධානියා, පළමු පුරවැසියා තෝරා ගැනීමේ මැතිවරණයක් බැවින් සමස්ත ප්‍රචාරක කාලය තුළ එම තෝරාගැනීමට නියමිත තනතුරේ ගෞරවය රැකෙන ලෙස කටයුතු කිරීමට අපේක්ෂකයන් හා ඔවුන්ගේ ආධාරකරුවන් ක්‍රියා කළ යුතුව ඇත.

එබැවින් අප සියලුම අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් කරුණු කෙරෙහි සැළකිලිමත් වන ලෙස ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිමු.

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1981 අංක 15 දරන ජනාධිපති මැතිවරණ පනත ඇතුළු ජනරජයේ සෙසු සියලු නීති උල්ලංඝණය නොකිරීම.
2. මැතිවරණ ව්‍යාපාරය තුළ පොලිතින් භාවිතයෙන් බැහැරවීම හා පරිසර හිතකාමී මැතිවරණ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
3. මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ සහ උපමාන ප්‍රකාරව කටයුතු කිරීම
4. මැතිවරණ ප්‍රවර්ධන කටයුතු පවත්වාගෙන යාමේදී කිසිදු නීති විරෝධී හෝ යුක්ති සහගත නොවන ක්‍රියාවක් සිදු නොකිරීම.
5. ප්‍රචණ්ඩත්වය පිටු දැකීම.
6. ඡන්දය ලබාගැනීමේ අරමුණෙන් මැතිවරණ දූෂණ කටයුතු හෝ ඡන්ද දායකයන්ට අල්ලස් ලබා දීමෙන් වැළකී සිටීම.
7. ජනතා කැමැත්ත විෂයෙහි අයුතු බලපෑම් සිදුවන සියලු ක්‍රියාවන් වැළැක්වීම
8. වාර්ගික සහ ආගමික වෛරය පැතිරවීම සහ හෝ අනුබල දීම සිදු නොකිරීම
9. රාජ්‍ය බලය හෝ රාජ්‍ය දේපළ අයථා ලෙස මැතිවරණ ව්‍යාපාරයට භාවිත කිරීමෙන් වැළකී සිටීම.
10. යහපත් දේශපාලන සංස්කෘතියක් ඇති කිරීමේ පරමාර්ථයෙන් සෑම කල්හිම ක්‍රියාත්මකවීම.

සෑම අපේක්ෂකයෙකුගෙන්ම අප ඉල්ලා සිටින්නේ තමන් ජනාධිපති ධූරය සඳහා සුදුස්සෙකු බව තම මැතිවරණ ව්‍යාපාරය තුළ ක්‍රියාකාරිත්වයෙන් ඔප්පු කරන ලෙස ය.

ස්තුතියි.
මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,
විධායක අධ්‍යක්ෂ.

# No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2 558 570 / 11 2 558 571 Fax: (+94) 11 2 558 572
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk